# ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට අයත් අප්‍රකාශිත ශිලාලේඛන පහක් පිළිබඳ අධ්‍යයනයක්

කන්තලේ සුමිත්ත හිමි[1], ඉන්දික විතානගේ[2]

## හැඳින්වීම

මෙම පර්යේෂණ පත්‍රය මගින් ඉදිරිපත් කරනු ලබන අභිලේඛන සියල්ල ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් වේ. මුහුද ආශ්‍රිත කලාපයක පිහිටා තිබීම විශේෂත්වයක් වන අතර ශ්‍රී ලංකාවේ පැරණි වෙළඳ තොටුපලක් වන ගෝකණ්න වරාය ද මෙම ප්‍රදේශයට අයත් වී තිබේ. අතිතයේ සිට මෙය විදේශ වෙළඳාමට අමතරව යුධ හා සංස්කෘතික කටයුතුවල දී ද භාවිත වුණු තොටුපලක්වේ. මෙම දිස්ත්‍රික්කය තුළ ගෝකණ්ණ විහාරය, තිරියාය, වෙල්ගම් වෙහෙර හා සේරුවිල ආදී සුප්‍රසිද්ධ ස්ථාන විශාල ප්‍රමාණයක් පිහිටා ඇත. වර්තමානයෙහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11කින් යුක්ත දිස්ත්‍රික්කයක් වන මෙහි සිංහල, දෙමළ හා මුස්ලිම් ජනකණ්ඩායම් ජීවත් වේ.

## පර්යේෂණ ගැටලු

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අභිලේඛන පිහිටුවීමට බලපාන ලද සාධක, ඉන් අනාවරණය වන ඓතිහාසික තොරතුරු හා පැරණි මානවයා පිළිබඳ අධ්‍යයනයේ දී එම ශිලාලේඛන කවර තරමේ බලපෑමක් ඇති කරනු ලබන්නේදැයි විමසීම.

## පර්යේෂණ ක්‍රමවේදය

ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් මූලික සාධක සොයාගන්නා අතර පුස්තකාල ආශ්‍රයෙන් පූර්ව පර්යේෂණ හා ශිලාලේඛනවල අන්තර්ගත කරුණුවලට අදාළ දත්ත විශ්ලේෂණය කරනු ලැබේ.

## පර්යේෂණ අරමුණු

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ශිලාලේඛන දත්ත එක්රැස් කොට විශ්ලේෂණය කරමින් අතීත සමාජයේ ඒ ඒ පැතිකඩ පිළිබඳ තොරතුරු උදාහරණ සහිතව ඉදිරිපත් කරමින් නව තොරතුරු සමාජ ගත කිරීම පර්යේෂණයේ අරමුණ වේ. දේශපාලන, ආර්ථික, ආගමික, සාමාජික මෙන් ම භාෂා සම්ප්‍රදායයන් පිළිබඳ ව තොරතුරු අධ්‍යයනය කිරීම ද පර්යේෂණ අරමුණක් වේ.

[1] අභිලේඛන හා නාණකවිද්‍යාංශය (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)
ksumiththa@gmail.com
[2] විාත්මක සහකාර (පුරාවිා පශ්චාත් උපාධි ආයතනය)

## ප්‍රතිඵල හා සාකච්ඡාව

### 1. සේරුවිල කාවන්තිස්සපුර ආරණ්‍යයේ ලෙන් ලිපිය

සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාවන්තිස්සපුර ග්‍රාමනිලධාරී වසමේ මෑතකදී ඉදිකරණු ලැබූ ආරණ්‍යයේ විශාල ලෙනේ කටාරමට පහළින් ලෙන් ලිපිය කොටා තිබේ. ස්ථානීය පිහිටීම උතුරු අක්ෂාංශ 08° 20' 05.10" ක් ද නැගෙනහිර දේශාංශ 81° 19' 02.25" ක් ද වේ. එක් අක්ෂර පෙළක් සහිත ශිලාලේඛනයේ දිග සෙන්ටි මීටර් 36 කි.



**පෙළ** - මහ තිශහ

**අර්ථය** - මහා තිස්සගේ

මහ තිශ යන වචනය සංඥා නාමයකි. **තිශ** යන්න සංස්කෘත භාෂාවේ **තිෂ්‍ය** සහ පාලි භාෂාවේ **තිස්ස** යන වචනවල මූල සිංහල ස්වරූපය වේ (Paranavitana 1970: 109). තිශ යන නම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය වෙනසකින් තොරව භාවිත කර ඇත. මොවුන් අතර භික්ෂූන් වහන්සේලා, රාජකීයන්, පරුමක, ගමික, බත, නාට්‍යකරුවන් වැනි විවිධ සමාජ තලයන් නියෝජනය කළ අය වේ (Ibid : I- cxxv).

### 2. කාවන්තිස්සපුර ආරණ්‍යයේ ගිරි ලිපිය

ඉහත භූමියේ මෙම ගිරි ලිපිය දක්නට ලැබේ. මෙහි ස්ථානීය පිහිටීම උතුරු අක්ෂාංශ 08° 20' 04.11" හා නැගෙනහිර දේශාංශ 81° 19' 02.15" කි. එක් අක්ෂර පෙළක් සහිත ශිලාලේඛනයේ දිග සෙන්ටි මීටර් 96 කි. ඇතැම් අක්ෂර විනාශව ඇති හෙයින් පූර්ණ අර්ථයක් ගත හැකි සේ කියවිය නො හැකි ය.



**පෙළ** -- පස නකරිය -- කරිපබ

**අර්ථය** ..... (පාලන ප්‍රදේශයේ) නගරය ...

පස යන්නෙන් පාලන ප්‍රදේශය අර්ථය වේ. අනුරාධපුරයෙන් නැගෙනහිර ප්‍රදේශය 'පචින පස' යනුවෙන් හඳුන්වා ඇත (රණවැල්ල 2004: 188). කල්අඩි පුරාවිා ස්ථාන ගිරි ලිපියක ද පචින යන වචනය සඳහන්වේ (කොඩිතුවක්කු 2014: 57). නකර යනු නගරය යන අදහස වේ (රණවැල්ල 2004: 106).

### 03. ත්‍රිකුණාමලය කෞතුකාගාරයෙහි පුවරු ලිපිය

මෙම ලිපිය කෞතුකාගාරයට ගෙනා ස්ථානය අවිනිශ්චිත ය. ස්ථානීය පිහිටීම උතුරු අක්ෂාංශ 08° 33' 59" හා නැගෙනහිර දේශාංශ 81° 14' 00" වේ. එක් අක්ෂර පෙළක් සහිත දිග සෙන්ටි මීටර් 42 කි.



**පෙළ** - බත නගශෙන(හ)

**අර්ථය** - බත නාගසේනගේ

පාලි භාෂාවෙහි 'භන්තෙ' යන්නට සමීප ව සැකසී ඇති මෙහි අර්ථය වනුයේ 'ස්වාමී' යන්නයි. 'ස්වාමී' යන්න භික්ෂූන් වහන්සේලාට ගෞරවාන්විත ව ඇමතීම සඳහා යෙදේ. 'බත' යන්නෙහි ස්ත්‍රී ලිංග පදය 'බතිය' වේ (Paranavitana: 3). 'බත නගශෙන' ද භික්ෂුවක් හෝ කිසියම් ප්‍රභුවරයෙකු වූ බව පැහැදිලි වේ. නාගසේන යනු සංඥා නාමයයි. පැරණි ප්‍රාකෘත ලේඛනයේ දීර්ඝ ස්වර කෙටි වීම බහුලව සිදුවිය. එමෙන් ම 'ස' අක්ෂරය වෙනුවට 'ශ' අක්ෂරය ආදේශවීම හඳුනාගත හැකි ය (අමරවංශ හිමි, 1969). උදා -: තිස්ස - තිශ, උපාසිකා - උපශික, මේ ආකාරයට නාගසේන යන්න නගශෙන වී ඇත. 'හ' කාරයෙන් ඔහුගේ අයිතිය හඟවා තිබේ.

### 4. පච්චනූර් ලෙන් ලිපිය

මූතූර් නගරයේ සිට කිලෝමීටර් තුනක් පමණ සේරුවිල මාර්ගයේ පැමිණි විට පච්චනූර් ගල්කන්ද හමු වේ. මහවැලි ඩෙල්ටාවේ පිහිටි උසින් වැඩිම ස්ථානයයි. ස්ථානීය පිහිටීම උතුරු අක්ෂාංශ 08° 25' 06.10" හා නැගෙනහිර දේශාංශ 81° 16' 07.20" වේ. ලිපිය එක් අක්ෂර පෙළකි.



**පෙළ** - බති තිශශ ලෙණෙ

අර්ථය - ස්වාමි තිස්සාගේ ලෙණ

මෙම අවධියට අයත් ඇතැම් සෙල්ලිපිවල 'බති' යන්න සහෝදර යන අරුතින් යෙදී තිබේ. ඒ අනුව 'දශ බතිකන' යන්න 'දසබෑ' නැතහොත් සොහොයුරන් දස දෙනා ලෙස අර්ථ දක්වා ඇත (Ibid: 3). නමුත් මේ ආකාරයට නාමයකට පෙර 'බති' යන්න 'බත' යන්නෙහි ස්ත්‍රී ලිංග පදය ලෙස පරණවිතාන සලකා ඇත (Ibid: cxi). බති යන්නට අපරව යෙදෙන තිශ මේ ස්ත්‍රී ලිංග සංඥා නාමයකි. ඉන් තිස්සාගේ යන අරුත දීර්ඝ ස්වර කෙටිවීමේ ප්‍රාකෘත රීතියට අදාළව එය සිදුව තිබෙයි. ''බති තිස්සා'' යනුවෙන් යෙදුණු අවස්ථාවක් මණ්ඩාගල ලෙන් ලිපියේ ද දක්නට ඇත (Ibid : 44).

"ලෙණ" යන වචනය සකස් ව ඇත්තේ සංස්කෘත භාෂාවේ "ලයන" හා පාලි භාෂාවේ "ලෙන" යන වචනවලිනි (Ibid : 120). ක්‍රිස්තු පූර්ව යුගයේ ලෙන යන පදය සටහන් කිරීමේ දී දන්තජ ''න''වෙනුවට මූර්ධජ "ණ" සුලභ ව ආදේශ කර තිබේ. මහාරාෂ්ට්‍ර ඇතුළු බොහෝ ප්‍රාකෘත උප භාෂාවල දන්තජ "න" රීතියක් වශයෙන් මූර්ධජ "ණ" අක්ෂරයට හැරෙන බව පරණවිතාන සඳහන් කරයි (Ibid : xxxii).

5. පච්චනූර් ගිරි ලිපිය

උක්ත ලෙන් ලිපියට ආසන්න පර්වතයේ මේ ලිපිය පිහිටා ඇත. ස්ථානීය නිශ්චිත පිහිටීම උතුරු අක්ෂාංශ 08° 25' 06.10" හා නැගෙනහිර දේශාංශ 81° 16' 07.20" වේ. ලිපිය අක්ෂර පෙළි තුනකි.



පෙළ

1. ගපති නමලිය ච
2. ගපති චිතශ ච
3. වෙලුශ ච

අර්ථය

ගෘහපති නමලියගේ ද ගෘහපති චිත්තගේ ද වේලුගේ ද

'ගපති' යනු පැරණි සමාජයේ තනතුරක් ලෙස විද්වතුන් අදහස් දක්වා ඇත. නමුත් සමකාලීන ඉන්දීය සෙල්ලිපිවල ද ගපති යන වදන තිබේ. එනමින් සමාජයේ නිශ්චිත කුලයක්වූ බව රොමිලා තාපර් හා කෝසම්බී විසින් පෙන්වා දී ඇත. විනය අටුවාව උපුටා දක්වන අමරදාස ලියනගමගේ අනුරාධපුර සමාජයේ ද 'ගපති' යනුවෙන් කුලයක් වූ බව පෙන්වාදෙයි (ලියනගමගේ, 2010: 184). මෙම ලිපියේ "ච" කාරය යෙදී ඇත්තේ "ද" යන අරුතිනි.

සමෝධානය

අප්‍රකාශිත මේ ශිලාලේඛනවලින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය අතීතයේ පැවති භික්ෂු සමාජය පිළිබඳවත් ඒ ඒ කලාප පාලනය කළ නිලධාරීන් පිළිබඳවත් තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි වූ බව සඳහන් කළ හැකි ය.

ප්‍රමුඛ පද : අනුරාධපුර යුගයේ මුල්සමය, අභිලේඛන, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, අප්‍රකාශිත ශිලාලේඛන, පච්චනූර් ගල්කන්ද

ආශ්‍රිත ග්‍රන්ථ

කොඩිතුවක්කු, නාමල. (2014). ''ත්‍රිකුණාමල කල්අඩි පුරාවිද්‍යා ස්ථානයේ ශිලාලේඛනවලින් හෙළිවන පුරාණ සමාජය'' විද්‍යාරණී ශාස්ත්‍රීය සංග්‍රහය, *මහාචාර්ය මැන්දිස් රෝහණදීර උපහාර කලාපය,* ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිාලය, නුගේගොඩ.

*ධාතුවංසය.* (2010). (සංස්.) තිලකසිරි, සිරි. කොළඹ -10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

Paranavitana, S. (1970). *Inscriptions of Ceylon*. Vol. I, Early Brahmi Inscriptions, Department of Archaeology, Colombo.

රණවැල්ල, එස්. (2004). *සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය.* කොළඹ -07: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ලියනගමගේ, අමරදාස. (2010). *පූර්ව නූතන ශ්‍රී ලංකාව සමාජය රාජ්‍ය සහ ආගම.* කොළඹ: සමාජවිාඥයින්ගේ සංගමය.

විමලකිත්ති හිමි, එම්. (1957). *ශිලාලේඛන සංග්‍රහය.* දොඩන්ගොඩ සහ සමාගම, මොරටුව.